# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2355/13 – 2023 ඔක්තෝබර් මස 23 වැනි සඳුදා – 2023.10.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2021/09.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2342/05 දරන හා 2023.07.24 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් හොරණ, පෝරුවදණ්ඩ, රත්මල්ගොඩ, මැදගේවිටුව පාර, අංක 442/18 හි පදිංචි කේ. ජී. කේ. සේනාරත්න මයා සහ කොළඹ 09, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, නො. 609 හි පිහිටි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 55/2022 දරන හා 2023.06.21 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 55/2022 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2024.07.24 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ඔක්තෝබර් මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 040580 – 11 (2023/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පළමුවන උපලේඛනය

**'අ' ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
නො. 609,
දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 09 .

දිනය : 2023 සැප්තැම්බර් මස 26 වැනි දින.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටයි,

2023 ජූලි මස 24 දිනැති අංක 2342/05 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද, කේ. ජී. කේ. සේනාරත්න සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව බැඳී සිටින්නා වූ ද, 2023 ජූනි මස 21 වැනි දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*අත්සන :*

සභාපති,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව.

කළමණාකාර අධ්‍යක්ෂ,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව.

*පිටපත* : (අනෙක් පාර්ශ්වය)
කේ. ජී. කේ. සේනාරත්න,
අංක 442/18, මැදගේට්ටුව පාර,
රත්මල්ගොඩ, පෝරුවදණ්ඩ,
හොරණ.

1. ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුට ම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) සහ 20(1) වන වගන්ති බලන්න)

2. දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවා යෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද, යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 10 – 0230

මගේ අංකය: IR/COM/01/2020/81.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2344/12 දරන හා 2023.08.07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 216, 04 වන මහල, ''මඟ නැගුම මහ මැඳුර'', මාර්ග සංවර්ධන අධිකාරියෙ හි පිහිටි ඉඩම්, සමාජ හා පරිසර කටයුතු පිළිබඳ ඒකාබද්ධ වෘත්තිකයන්ගේ සංගමය සහ බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 216 හි පිහිටි ''මඟ නැගුම මහ මැඳුර'', මාර්ග සංවර්ධන අධිකාරිය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 36/2023 දරන හා 2023.07.11 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 36/2023 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2024.08.07 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ඔක්තෝබර් මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පළමුවන උපලේඛනය

**'අ' ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : එල්. වී. එස්. වීරකෝන්,
අධ්‍යක්ෂ ජනරාල්, 01 වන මහල,
''මඟ නැගුම මහ මැඳුර'',
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.

දිනය : 2023 සැප්තැම්බර් මස 21 වැනි දින.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටයි,

2023 අගෝස්තු මස 07 දිනැති අංක 2344/12 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද, මාර්ග සංවර්ධන අධිකාරිය සහ මාර්ග සංවර්ධන අධිකාරියේ ඉඩම්, සමාජ හා පරිසර කටයුතු පිළිබඳ ඒකාබද්ධ වෘත්තිකයන්ගේ සංගමය බැඳී සිටින්නාවූ ද, 2023 ජූලි මස 11 වැනි දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*අත්සන :*

එල්. වී. එස්. වීරකෝන්,
අධ්‍යක්ෂ ජනරාල්,
මාර්ග සංවර්ධන අධිකාරිය.

*පිටපත :*

ඉඩම්, සමාජ හා පරිසර කටයුතු පිළිබඳ ඒකාබද්ධ වෘත්තිකයන්ගේ සංගමය,
04 වන මහල, ''මඟ නැගුම මහ මැඳුර'',
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.

EOG 10 – 0231

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.